# ස්වාධීන වෘත්තීය සමිති හා බහුජන සංවිධාන එකතුව

2026 ජූලි මස 22 දින

මාධ්‍ය ආයතන ප්‍රධානී / ප්‍රවෘත්ති කර්තෘ
සියලුම මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය

මහත්මයාණෙනි/මහත්මියනි,

## මාධ්‍ය නිවේදනය

අනුරාධපුර අටමස්ථානාධිපති භික්ෂුව විසින් සිදුකළැයි චෝදනා එල්ලව ඇති බරපතල ළමා අපහරණයන් පිළිබඳ සිදුකෙරෙන විමර්ශනය ගැන සොයා බැලීමට ජූනි මාසයේ මුල් සතියේ කැඳවන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ රැස්වීමකට අදාල තොරතුරු වාර්තා කිරීම සම්බන්ධයෙන් බීබීසී සිංහල සේවයේ මාධ්‍යවේදීන් 2026 ජූලි 23 දින පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව හමුවට කැඳවීම ප්‍රජාතන්ත්‍ර විරෝධී වූද, තොරතුරු දැනගැනීමේ හා ප්‍රකාශනයේ නිදහසට එරෙහි වූද අත්තනෝමතික බලහත්කාරයක් සේ අපි හෙළා දකිමු.

මහජන සුබ සිද්ධිය තහවුරු කරනු පිණිස තොරතුරු වාර්තාකිරීමට මාධ්‍යවේදීන් සතු වෘත්තීය අයිතියත්, එම තොරතුරු දැනගැනීමට පොදු මහජනතාව සතු පරම අයිතිවාසිකමත් ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අනුල්ලංඝනීය අයිතීන් සේ සැළකේ. දේශපාලන, මිලිටරිමය, පරිපාලන හෝ ආගමික බලාධිකාරයන් විසින් ස්වකීය අසීමිත බලය අපහරණය කරමින් සිදුකරන මහජන විරෝධී සහ දූෂිත ක්‍රියාපිළිවෙත් අනාවරණය කිරීමටත්, ඒවා ගැන දැනගැනීමටත් ඇති අවකාශය 'පාර්ලිමේන්තු වරප්‍රසාදයන්"ට මුවා වී අවුරා දැමීම අයත් වන්නෙ ඉකුත් 76 වසරක මහජන විරෝධී දේශපාලන උරුමයට ය.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය ව්‍යවස්ථාපිත ආයතනයක් නොවන අතර ඒ නිසාම එහි සාකච්ඡා කරනු ලබන කවර හෝ කරුණක් ජනමාධ්‍යයට අනාවරණය වී නම්, මාධ්‍ය විසින් එය වාර්තා කිරීම පාර්ලිමේන්තු වරප්‍රසාද කඩකිරීම පිළිබඳ ප්‍රශ්නයකට කිසිසේත් තුඩු නොදෙන බව අපි විශ්වාස කරමු. ඒ වෙනුවට, එමගින් පෙන්නුම් කරන්නේ තමන් සතු රාජ්‍ය බලය මහජනයාට හිමි තොරතුරු දැනගැනීමේ අයිතියත්, නිර්බාධිතව තොරතුරු වාර්තාකරණයට ස්වාධීන මාධ්‍යවේදීන්ට හිමිව ඇති අයිතියත් මැඩලීමට අත්තනෝමතික ලෙස යොදාගත හැකියැයි පාර්ලිමේන්තු නියෝජිතයන් විසින් දරණ ප්‍රජාතන්ත්‍ර විරෝධී ආකල්පයයි.

දේශපාලන අනුග්‍රහයත්, සමාජ බලයත් හිමි ආගමික බලධාරියකු විසින් සිදුකර ඇති බවට බලවත් සාක්ෂි ඉදිරිපත්ව තිබෙන අනුරාධපුර ළමා අපහරණ සිදුවීම පිළිබඳ පරීක්ෂණවල අපක්ෂපාතී බව සහ පාරදෘෂ්‍යභාවය සම්බන්ධයෙන් මුල සිටම බරපතල හා සාධාරණ සැක මතුව ඇති තත්ත්වයක් තුළ ඒ පිළිබඳ විමර්ශනාත්මකව වාර්තාකිරීමට ජනමාධ්‍යවේදීන් උත්සුක වීම මාධ්‍ය වෘත්තීය වගකීමට අයත් අයිතියකි. අවම වශයෙන් පාර්ලිමේන්තු කාරක සභාවකට හිමි ව්‍යවස්ථාමය බලයක් පවා නොමැති, ස්වේච්ඡා පදනමින් රැස්වන මන්ත්‍රී ගොණුවකට එකී අයිතිය කඩකිරීමට කිසිදු බලයක් නොතිබිය යුතු ය.

කරුණු එසේව තිබියදීත්, ස්වකීය වෘත්තීය වගකීම ඉටුකළ බීබීසී මාධ්‍යවේදීන්ට එරෙහිව, තම වරප්‍රසාද කඩකළේයැයි පදනම් විරහිත චෝදනා මත පාර්ලිමේන්තු වරප්‍රසාද කමිටුව හමුවට කැඳවීම අතීතයේ පැවති මාධ්‍ය

මර්දනකාරී පිළිවෙත් පෙරට ගෙනයාමක් මෙන්ම මහජනතාවට වැදගත්වන තොරතුරු වසන්කිරීමේ කූට ප්‍රයත්නයක් ලෙස අපි දකිමු.

පූර්ණ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් තහවුරු කිරීමේ ප්‍රතිඥාව මත බලයට ආ ජාතික ජන බලවේග ආණ්ඩුව නියෝජනය කරන මන්ත්‍රීවරියකගේ පැමිණිල්ලක් මත මාධ්‍යයට එරෙහිව සිදුකරන මෙකී බලහත්කාරය වහාම නවතන ලෙස කියා සිටින අපි, විශේෂයෙන්ම මාධ්‍යවේදීන්ගේ වෘත්තීය අයිතියත්, පොදුවේ මහජනයා සතු තොරතුරු දැනගැනීමේ අයිතියත් උල්ලංඝනය කරන සියළු ක්‍රියාමාර්ග හකුළාගන්නා ලෙසත් රජයට බලකර සිටිමු.

මෙයට - සහෝදරත්වයෙන්,

**අනූප නන්දුල**
ජ්‍යේෂ්ඨ උප සභාපති
ලංකා බැංකු සේවක සංගමය

**ඇන්ටන් මාකස්**
සම ලේකම්
නිදහස් වෙළඳ කලාප හා පොදු සේවා සේවක සංගමය

**ජෝශප් ස්ටාලින්**
ප්‍රධාන ලේකම්
ලංකා ගුරු සංගමය

**චතුර සමරසිංහ**
ප්‍රධාන ලේකම්
ලංකා වතු සේවා සංගමය

**ඩබ් ඒ ඩී විමලරත්න**
සභාපති
ශ්‍රී ලංකා ජනරජ සෞඛ්‍ය සේවා සංගමය

**ජගත් ගුරුසිංහ**
ජ්‍යේෂ්ඨ උප සභාපති
ශ්‍රී ලංකා සියලු විදුලි සංදේශ සේවක සංගමය

**එස් අමරසිංහ**
ලේකම්
වාණිජ හා කාර්මික සේවක සංගමය

**මංජුල ජයසුන්දර**
ප්‍රධාන ලේකම්
තැපැල් හා විදුලි සංදේශ නිලධාරීන්ගේ සංගමය

**නන්දන උදය කුමාර**
උප සභාපති
ලංකා විදුලිබල මණ්ඩල තාක්ෂණික ඉංජිනේරු හා අධිකාරී සංගමය